# රවීන්ද්‍රනාත් තාගෝර් හා භාරතීය සංගීතය

දයාරත්න රණතුංග විසිනි

භාරත පරිසරයේ පැවති අපරිමිත සෞන්දර්යය ජන ජීවිතය සුමගට හැරවූ බව සත්‍යයකි. එම සෞන්දර්යයත් කලාවත් එකම චිත්‍රයක අන්‍යොන්‍ය සම්බන්ධතාවයකින් පවත්නා, වර්ණයන් සේ සැලකීම නිවරදයයි සිතේ. මෙම අදහස තාගෝර් තුමා කළ නිර්මානයන් ගෙන් වඩාත් තහවුරු විය. එතුමා සිතෙහි ඇතිවූ කවි සංකල්පනාවක් කාව්‍යයට නැගී ය. එයම එතුමා චිත්‍රයට නැගී ය. එම කාව්‍යයට සංගීතය කැවීමේ දී එතුමා කොතරම් දක්ෂවී ද යත්, එම කාව්‍යයේ වචන හැර තනුව පමණක් ගායනය කිරීමෙන්ම එතුමාගේ සිතෙහි ඇතිවූ භාවය ප්‍රකාශනය විය. එතුමා අතින් ලියැවුනු කවිය, එතුමාගේ තෙලිතුඩින් නැඟුනු චිත්‍රය, එතුමාගේ මුවින් පිටවූ සංගීත රාවය යන තුනම එකම භාවයක් ප්‍රකාශනය කිරීමට සමත් විය. ඒවා එතරම්ම එකට මුසුවූ බවක් පෙණෙන්නට තිබුණි.

''තෛවරහි'' යනු පුරාතන භාරතයේ ජනතාව අතර ප්‍රචලිතව පැවැතුණු උදගීත මාධුර්යයකි. එයින් උදෑසන පිබිදෙන ජනතාව තුල ඇතිවන භාවයන් ප්‍රකාශ කෙරිණි. සෑම කාලයකම සෑම උදෑසනකම ගැයිය හැකි පොදු ගීතයක් වශයෙනි මෙය සැලකෙන්නේ. ඒ ගීතය කොතරම් භාවාත්මකවීද යත් ගයනු ලබන සෑම අවස්ථා-වකදීම සිත්හි පවත්නා බර සැහැල්ලු කිරීමට සමත් විය. භාරත ජනයා තම සිතෙහි බර ඉවතහෙලා දිනචර්යාවට අනුව, ''වෛරහී'' උදගීතය ගයා පිබිදුනු සිතත් ඇතිව දවසේ වැඩ පටන් ගැනීමට පුරුදුව සිටියහ.

''පුරභි'' යනු එබඳුම සන්ධ්‍යා ගීතයෙකි. මේ ගීතයද සකස්වූයේ සෑම සන්ධ්‍යාවකටම ගැයිය හැකි අන්දමකිනි. එය සන්ධ්‍යාවකට උචිත භාව-යන්ගෙන් පරිපූර්ණ විය.

මුලින් භාරතයේ පැවතියේ ''රාග'', ''රාගිණී'' සම්ප්‍රදයයි. මේවා තුල කිසිදු පෞද්ගලික භාවයන් ගැප් නොවී ය. මේවා එකිනෙකින් වෙන්කර පෙන්විය හැකි පරිදි නොයෙක් නීති රීති වලින් බැඳී පවතින සංගීතයේ මූලධර්ම විශේෂයෙකි. කාලයත් සමගම සංගීතයේ නව නිර්මාණ මතුවීම නිසා භාරත සංගීතය ක්‍රමක්‍රමයෙන් දියුණුවට පත් විනි.

මේ අතර මහාකවි රවීන්ද්‍රනාත් තාගෝර් තුමා විසින් එතෙක් සොයා නොගත් සංගීත ශෛලියක් හඳුන්වා දෙනලදී. ස්වකීය නව ශෛලිය

මාධ්‍යයෙන් ජීවිතයේ විවිධ මුහුනුවර ජනතාවට පෙන්වීමට එතුමා උත්සාහ කෙළේ ය.

ඉහතින් සඳහන් කරන ලද ''වෛරභි'' ගායනා ක්‍රම තාගෝර් තුමා අතින් විවිධ ඍතුවලට ගැලපෙන සේ සකස්වුනි. වසන්ත, හේමන්ත ආදී ඍතුවලට ගැලපෙන පරිදි සකස්වුනු එම ගීතාවලිවලින් උදාසනක ඇතිවන සොම්නස් සහගත හැඟීම් මෙන්ම දෙම්නස් සහගත හැඟීම්ද වෙන්වෙන් වශයෙන් ප්‍රකාශවිය.

ප්‍රේමාන්විත බවෙන් මතුවන වියෝ වියරුව මුල්වතාවට ගායනා ක්‍රමවලට ඇතුලත් වූයේ තාගෝර් තුමාගෙන් බව විශ්වාස කරනු ලැබේ.

භාරතීය කලාවෙන් ප්‍රකාශනය වූයේ විශ්වයට මුසුවුනු විෂයානුබද්ධ අවස්ථාවකි. පුරාණ භාරතීය ශාස්ත්‍රීය සංගීතයෙන් පෞද්ගලික භාව ප්‍රකාශනයක් සිදු නොවී ය. පුරාණ සංගීතඥයෝ ''රාග'' ගැයීමේදී ඒවායේ විවිධ ලක්ෂණයන් හා ඒවායේ ඇති ගැඹුරු බව පෙන්නුම් කළා මිස තම සිත්හි ඇතිවුන රසභාවයන් ප්‍රකාශ කිරීමට උත්සාහ නොකළහ. එහෙත් කලාවෙන් සිදුවිය යුත්තේ පෞද්ගලික රසභාව ප්‍රකාශනය බව ප්‍රචලිත මතයකි.

තාගෝර් තුමන්ගේ භාරතීය ශාස්ත්‍රීය සංගීතයට සිදුවූ මුල් සේවය වශයෙන් කිවහැක්කේ, දැඩිලෙස පනවා තිබූ නීති රීතිවලින් මුදවා පෞද්ගලික භාව ප්‍රකාශනයට ඉඩ සැලසීම ය. ඉන් ඔහු ලේඛන ගත විවිධ භාව ගීත ගෙන ඒවාට උචිත පරිදි තනු සම්පාදනය කළේ ය. මේ නිසා සාහිත්‍යයත් සංගීතයත් අතර සම්බන්ධය වඩාත් තහවුරු විය. භාරතයේ රාජ්‍ය මන්දිරවලට සීමාවී තිබුණු සංගීතයද රවීන්ද්‍රනාත් තාගෝර් තුමන් විසින් බැහැරට ගන්නා ලදී. තාගෝර් තුමාට ඕනෑවූයේ ශබ්ද රසයත් අර්ථ රසයත් ස්වකීය සංගීත සම්ප්‍රදයෙන් හෙලිකිරීමට ය. ඔහු එකකට පමණක් වහල්වූයේ නැත.

කවියක් ගීතයක් බවට පෙරළන විට ඇතැම් වංග කවිවල තිබූ කයෝර භාවය සවර කැවීමක් සමගම මෘදු මොළොක් බවක් ගත්තේ ය. කවියක ඇති රිද්මය හා ගීතයක ඇති රිද්මය අතරත් මූලික වෙනසක් දක්නට ලැබේ. කිසියම් කවියක් ගත්කළ එහි සීමාසහිත මාත්‍රා සමූහයක් ඇත. එය වෙනස් නොවන්නකි. එහෙත් එම කවියේ වචනම ගීතයක් වශයෙන් යෙදූ කළ නම්‍ය-අනම්‍ය වශයෙන් වෙනසක් සිදුවේ. කවියක ඇති ස්වාභාවික උච්චාරණය ගීතයක් වූකල අපූරු නම්‍යතාවයක් ඇතිවේ. මේ නම්‍යතාවනම් මුල් කවියත් ඉන් බිහිවූ ගීතයත් අතර ඇති මාත්‍රාවලින් ගිණිය හැකි පරතරයයි.

කිසියම් ගීතයක ඊට ආවේනිකවූ රිද්මයක් ඇත. ගීතයක ගැබ්වූ භාවයට උචිත රිද්මයක් යෙදීම තාගෝර් තුමාගේ සංගීතයේ එක් ප්‍රකට ලක්ෂණයකි. තාගෝර් තුමා බෙංගාලි කාව්‍යයේ තිබුණු රිද්මයාණුකූල අනම්‍යතාවය බිඳහෙලා, ඒවායේ වචන අතර ඇති හිස්බව ප්‍රතිධවනීන්ගෙන් පුරවා බෙංගාලි කාව්‍යය උසස් භාව කාව්‍යයක් බවට පරිවර්තනය කෙළේ ය.

ශබ්ද රචනාවකට ගැලපෙන පරිදි වචන සකස් කිරීමද තාගෝර් සම්ප්‍රදයය විය. නිදසුනක් වශයෙන් ''බාජොරි බංවරි බාජෝ'' යන ගීතයෙහි ''මධුකර පධහර කම්පිත චම්පක අංගනෙ'' යන පාඨය ගත හැකි ය. මෙහි විශේෂය වශයෙන් දැක්විය හැක්කේ දෙවෙනි අක්ෂරය අවධාරණයෙන් ගායනය කිරීම ය. මෙයට සංගීතය කැවීමේ දී මේ වචනවල දෙවෙනි අක්ෂරය ස්ප්‍රෂ්ඨව ගායනය කළ හැකිපරිදි අනුරූපතාවයකින් යුක්තවූ ස්වරයන් මත පිහිටුවන ලදී. ඇතැම් ගීතවල වචන අතර විරාම ඇතිකර අමුතුම ආකාරයේ රිද්මයානුකූල භාවයක් ඇති කළේ ය. උදහරණ වශයෙන් ''මමෝ චිට්යි නිටි නරිත්යි''; හා ''ධිරෙ ධිරෙ ධිරෙ බොවො'' යන ගීත ගතහැකි යි.

තාගෝර් තුමා නව ''තාල'' කිහිපයක්ද බිහි කළේ ය. නිදසුන් වශයෙන් ''එකදසි'', ''රූපකාර'' හා ''නොබෝ'' යන තාල ගත හැකි ය. ''එකදසි'' තාලයෙහි ආවර්තය කොටස් තුනකට බෙද ඇත. ඉන් පළමු කොටසට මාත්‍රා තුනකුත් දෙවෙනි කොටසට මාත්‍රා 4 බැගිනුත් තුන්වෙනි කොටසට මාත්‍රා 4 බැගිනුත් ඇත. (3/4/4). ''රූපකාර'' තාලයෙහිද කොටස් තුනක් එයි. එහි ආවර්තය මාත්‍රාවලට බෙදී ඇත්තේ (3/2/3) වශයෙනි. ''නොබෝ'' තාලය දෙකොටසකට බෙදී ඇත. එහි ආවර්තය මාත්‍රා (3/6) වශයෙන් බෙද තිබේ.

තාගෝර් සංගීතයේ විකාශනය ගැනද යමක් කිව යුතු ය. පිළිගත් ගතානුගතික සම්ප්‍රදයට කවි සංකල්පනා සෑම එකක්ම අඩංගුකළ නොහැකි බව එතුමා පිළිගත්තේ ය. මේ අදහසින් මෙහෙයවුනු හෙතෙම නව මාධුර්යයන් සොයාගත්තේ රාග - රාගිණී සංයෝග කිරීමෙනි.

මෙයිනුදු ඉවත්වුණු හෙතෙම ජනසම්ප්‍රදයට, නැඹුරුවූයේ ය. ජනසම්ප්‍රදයේ ඇති නිර්ව්‍යාජ භාවයෙන් හෙතෙම නියම ප්‍රයෝජනය ලබාගත්තා පමණක් නොව ජනසම්ප්‍රදය තවත් පවිත්‍ර කෙළේ ය.

මීටත් පසුව හෙතෙම ජන කාව්‍ය සම්ප්‍රදයත් ශාස්ත්‍රීය සංගීත සම්ප්‍රදයයත් මිශ්‍ර කෙළේ ය. කොතෙක් නව නිර්මාන කළත් පෞරාණික, ශාස්ත්‍රීය පදනමෙන් පිටස්තරව යා නොහැකි ය.

රවීන්ද්‍රනාත් තාගෝර් තුමා ඒ පිළිබඳව මෙසේ පවසයි.

> ''මා නව නිර්මාන ගවේෂනයෙහි කෙතරම් යෙදුනත් මට පැරණි රාග-රාගිණිවලින් බැහැරට යා නොහැකි ය. මෙය සැමකලටම මෙලෙසින්ම පවතින බව විශ්වාස කරමි.''

තාගෝර් තුමා නොයෙක් දේශ දේශාන්තරවල ඇවිද සංගීත මාධුර්යයන් එකතු කර තමාගේ සංගීත ශෛලිය පරිපූර්ණ කිරීමට උත්සාහ ගත්හ. හෙතෙම ඇතැම් ගීතවලට තනුදැමීමේ දී බටහිර සංගීතයේද පිහිට සොයා ගියේ ය. උදහරණයක් වශයෙන් ''බල්මිකී ප්‍රතිච'' යන ගීතය ගත හැකියි.

එතුමාගේ ''අජී බහිවෙ බසන්ත'' යන ගීතය සංගීතවත් කෙලේ ''බහාර්'' රාගය මුල්කරගෙනය. එහි තනුව පෞරාණික හින්දුස්ථානි ගීතයක් ආශ්‍රයෙන් නිබන්ධකර ඇත. තාගෝර් තුමා නිබන්ධකළ තනුවෙහි අති මිහිරි බවක් හා නව තාවයක් පෙනෙන්නට ඇත.

''තාන්'' ගායනයට භාරතීය සංගීතයේ උසස් ස්ථානයක් හිමිවි ය. ආභරණ පැළඳීමෙන් ගැහැණිය අලංකාරවන්නා සේම, ගීත අලංකාර, කිරීමට ''තාන්'' ගායනා කිරීම භාරතීය සංගීතයේ විශිෂ්ඨ අංගයකි. එහෙත් ඕනෑවට වැඩියෙන් ආභරණ පැළඳීමෙන් ගැහැණියක් විරූප වන්නාසේම, ප්‍රමාණයට වැඩියෙන් ''තාන්'' ගායනය කිරීමෙන් ගීතයේ මිහිරි බව වෙනුවට අමිහිරි, කර්කශ භාවයක් උපදී. මෙය හොඳින් අවබෝධ කරගත් තාගෝර් තුමා තම ගීතයන්ට උචිත පරිදි සුදුසු ස්ථානයන්හි පමණක් ''තානාලංකාර'' යොද කර්ණරසායණ ගීතබවට පරිවර්තනය කළේ ය.

අවුරුදු හැටක් පමණ කාලයක් ඇතුලතදී රවීන්ද්‍රනාත් තාගෝර් තුමා අතින් තුන්දහසකට අධික ගීත නිබන්ධන වීය. මේ ගීත බිහිවීමත් සමගම භාරතීයයන් තුළ තිබූ පෞරාණික හැඟීම් වෙනුවට නව හැඟීම්ද ජනිතවන්නට විය. එය තාගොර් තුමා විසින් පොදුවේ භාරතීයයන්ට මෙන්ම භාරතීය සංගීතයට කරන ලද විශිෂ්ඨ සේවයක් වශයෙන් සැළකිය හැකි ය.